# මධ්‍යම පළාත් සභාව
# மத்திய மாகாண சபை
# CENTRAL PROVINCIAL COUNCIL

The Chief Ministry and Provincial Ministry of Finance and Planning, Law and Order, Local Government and Provincial Administration, Human Resources, Education and Cultural Affairs, Tourism, Land, Trade and Commerce, Food Supplies and Distribution, Environmental Affairs, Non-Investmentor Co-ordination & Portfolios Which are not taken under any other ministries

පළාත් සභා සංකීර්ණය, පල්ලේකැලේ, කුණ්ඩසාලේ.
மாகாண சபைக் கட்டடத் தொகுதி, பல்லேகலை, குண்டசாலை.
**Provincial Council Complex, Pallekele, Kundasale.**

විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / pomcentral@gmail.com — වෙබ් අඩවිය / இணையம் / Web- www.cm.cp.gov.lk

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| අමාත්‍යාංශ කාර්යාලය<br>அமைச்சு அலுவலகம்<br>Ministry Office | 081 - 4481321 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 081-2424938 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්<br>சிரேஷ்ட உதவிச் செயலாளர்<br>Senior Assistant Secretary | 081-2424936 | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | 081-2424935 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 081-2424938 |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | සිපිසි/සිඑම්එස්/1/26/4/16/2 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2024.07. 23 |

සම්මුඛ පරීක්ෂණය සුදුසුකම්ලාභීන් සියලුදෙනා වෙත,

**<u>මධ්‍යම පළාත් සභාව යටතේ පාලනය පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරී ගුරු භවතුන් බඳවා ගැනීම 2023 (I වන හාII වන අදියර)</u>**

උක්ත කරුණ සම්බන්ධව සුදුසුකම් පරීක්ෂා කර බැලීමේ සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය 2024.07.24 වන දින ගුරුදෙණිය ගුරු පුහුණු මධ්‍යස්ථානයේ දී පැවැත්වේ. ( එක් එක් විෂයයන්ට අදාළ වේලාවන් වෙබ් අඩවියේ සඳහන් කර ඇත.)

02. ඉහත බඳවා ගැනීමට සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගේ නාම ලේඛනය මේ සමඟ යොමු කර ඇති වෙබ් සබැඳිය මඟින් බාගත කල හැක.

03. සම්මුඛ පරීක්ෂණයට සහ ප්‍රායෝගික පරීක්ෂණයට සහභාගීවීම සම්බන්ධ උපදෙස් පහත පරිදි වේ.

<u>සම්මුඛ පරීක්ෂණය</u>

මෙම සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබූ ඉහත නාම ලේඛනයේ නම් සඳහන් අයදුම්කරුවන් එහි සඳහන් කර ඇති දින නියමිත වේලාවට පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් සහ සහතික කරන ලද ඡායා පිටපත් කට්ටලයක් රැගෙන නියමිත වේලාවට සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී විය යුතු අතර සම්මුඛ පරීක්ෂණය / ප්‍රායෝගික පරීක්ෂණ දිනට පසුව ඉදිරිපත් කරනු ලබන සහතික/ලේඛන පිළිබඳ සළකා බලනු නොලැබේ

1 සම්මුඛ පරීක්ෂණය / ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවීමේ ලිපිය
2 උප්පැන්න සහතිකයේ මුල් පිටපත (නමේ වෙනසක් ඇත්නම් දිවුරුම් ප්‍රකාශයක් සමඟ)
3 ජාතික හැඳුනුම්පත /වලංගු විදේශ ගමන් බලපත්‍රය /වලංගු රියදුරු බලපත්‍රය
4 ග්‍රාම නිලධාරි සහතිකය.විවාහයෙන් පසු මධ්‍යම පළාතේ පදිංචියට පැමිණි අයෙක් නම් කලත්‍රයාගේ ග්‍රාම නිලධාරි සහතිකය ,විවාහ සහතිකය සහ අදාළ වසමේ පදිංචි කාලය තහවුරු කෙරෙන ග්‍රාම නිලධාරි සහතිකය (2023.03.16 දින පැවති විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් 2023.09.08 වන දිනට හා 2024.04.20 දින පැවති විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් 2023.11.20 දිනට පූර්වාසන්න වසර 03ක් මධ්‍යම පළාතේ පදිංචි බව තහවුරු කර ගැනීම සඳහා)
5. අ.පො.ස. (සාමාන්‍ය පෙළ/උසස් පෙළ) විභාග සහතිකයේ මුල් සහතික

6. **2023.03.16** දින පැවති විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් 2023.09.08 වන දිනට හා 2024.04.20 දින **පැවති විභාගයට පෙනී සිටි** අයදුම්කරුවන් 2023.11.20 දිනට පෙර උපාධිය සම්පූර්ණ කළ බව සනාථ කර ගැනීම සඳහා උපාධි සහතිකයේ මුල් පිටපත

7. **විෂයයන්** දැක්වෙන **විස්තරාත්මක** උපාධි සහතිකයේ මුල් පිටපත ( Transcript- විෂයයන් තහවුරු කර ගැනීම සඳහා )

8. දැනටමත් ඔබ ස්ථිර රජයේ සේවයේ යෙදී සිටි නම් ආයතන ප්‍රධානියා විසින් නිකුත් කළ සේවයේ යෙදී සිටින බව සනාථ කරන සහතිකය

**<u>ප්‍රායෝගික පරීක්ෂණය</u>**

අයදුම්කරු අයදුම් කරන ලද විෂයට අදාළව අංක 1885/38 හා 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 'ආ' පරිශිෂ්ඨය අනුව සඳහන් උපදෙස් පරිදි අයදුම්කරුවන් විසින් හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. ඒ සඳහා පහත පරිදි ලකුණු දෙනු ලැබේ.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | අරමුණ හා ප්‍රවිෂ්ට වීම | 05 | 02 |
| 2 | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 3 | සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| 4 | කාල කළමනාකරණය | 05 | 02 |
| 5 | ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය | 25 | 10 |

**<u>ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය</u>**

1. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කාලය විනාඩි 05කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ.
2. ප්‍රායෝගික පරීක්ෂණය ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසි පහකි.
3. ප්‍රායෝගික පරීක්ෂණය සමත් වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 2 ක් බැගින් ලබා ගත යුතුය.
4. ප්‍රායෝගික පරීක්ෂණයේ ඇගයීම මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

**<u>නිර්ණායකයන්හි අරමුණ</u>**

1. අරමුණ හා ප්‍රවිෂ්ට වීම
   සාර්ථකව පාඩමෙහි අරමුණ පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිශ්ට වීමේ හැකියාව ඇගයීම
2. පෞරුෂය හා හඬ පාලනය
   ගුරුවරයෙකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේ දී මනා ලෙස හඬ පාලනය කිරීමේ හැකියාව ඇගයීම
3. සන්නිවේදනයේ පැහැදිලි බව
   ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අදාළ කරුණු ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම
4. කාල කළමණාකරණය
   ලබා දෙනු ලබන කාලසීමාව තුළ අරමුණ කෙරෙහි ළඟා වීමේ කුසලතාවය ඇගයීම
5. ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය
   අරමුණ කෙරෙහි ළඟා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිතා කිරීමේ හැකියාව ඇගයීම

04. එමෙන්ම ඉහත සඳහන් ලිපි ලේඛන සියල්ලෙහි සහතික කරන ලද ඡායා පිටපත් නැවත ඔබ වෙත ලබා නොදෙන බැවින්, එම සහතික අනු අංක පිළිවෙලට සකස් කරන ලද ලිපි ගොනුවක් රැගෙන ආ යුතු අතර, එම ගොනුවේ දකුණු පස කෙලවරේ පහත ඇමුණුම 1 හි දක්වා ඇති ලේබලයෙහි සඳහන් තොරතුරු සම්පූර්ණ කර අලවා රැගෙන ආ යුතුය.

05. සම්මුඛ පරික්ෂණයට /ප්‍රායෝගික පරික්ෂණයට පැමිණීම වෙනුවෙන් ඔබට ගමන් වියදමක් හෝ වෙනත් දීමනාවක් ගෙවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණයට / ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවමින් නිකුත් කරන ලද මෙම ලිපිය නොවරදවාම රැගෙන ආ යුතුය.

06. තවද මෙම සම්මුඛ පරීක්ෂණයට සහභාගිවීම මතම ඔබ වෙත පත්වීමක් ප්‍රදානය කිරිමට මෙම අමාත්‍යාංශය බැඳී නොමැති බව ද සැළකිය යුතුය.

එච්.එම්.එම්.යු.බී.හේරත්
ලේකම්
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය
මධ්‍යම පළාත